ශිෂ්‍යයෙක් පරීක්ෂණාගාරය තුළ දී සරල අවලම්බයක් භාවිතයෙන් ගුරුත්වජ ත්වරණය සෙවීමට සැලසුම් කරයි.

(a) (i) අවලම්බයේ දිග $l$ සහ ගුරුත්වජ ත්වරණය $g$ ඇසුරෙන් සරල අවලම්බයේ දෝලන කාලාවර්තය $T$ සඳහා ප්‍රකාශනයක් ලියා දක්වන්න.




______________________________________________

(ii) ප්‍රස්තාරයක් ඇඳීම මගින් $g$ වලට අගයක් ලබාගැනීම සඳහා ඉහත ප්‍රකාශනය වඩාත් සුදුසු ආකාරයට නැවත සකස් කරන්න.

______________________________________________

______________________________________________

(iii) $T$ සඳහා පාඨාංක ගැනීමේ දී ශිෂ්‍යයා අල්පෙනෙත්තක් (reference pin) ඉහත රූපයේ පෙන්වා ඇති $B$ ලක්ෂ්‍යයට යොමු වන සේ තබයි. අල්පෙනෙත්ත A ලක්ෂ්‍යයට යොමු කිරීමට වඩා $B$ ලක්ෂ්‍යයට යොමු කිරීම කාල මිනුම සඳහා වඩා නිරවද්‍යතාවක් ලබා දෙන්නේ ඇයි දැයි සඳහන් කරන්න.

______________________________________________

______________________________________________

(b) (i) ශිෂ්‍යයා විසින් එක් දෝලනයක් සඳහා පමණක් කාලය මනින ලද අතර එවිට ලැබුණු පාඨාංකය 2.0 s විය. කාල මිනුමේ ඇති උපකරණ දෝෂය 0.1s නම් දෝලන කාලාවර්ත අගයෙහි ප්‍රතිශත දෝෂය නිර්ණය කරන්න.

______________________________________________

______________________________________________

(ii) ඔහු විසින් එක් දෝලනයක් සඳහා කාලය මනිනු වෙනුවට දෝලන 25 ක් සඳහා කාලය මනිනු ලැබූ විට ඒ සඳහා ලැබුණු අගය 50.2 s විය.

කාල මිනුම් අගයෙහි ප්‍රතිශත දෝෂය නිර්ණය කරන්න.(ඔබගේ පිළිතුර ආසන්න පලමු දශම ස්ථානයට දෙන්න.)

______________________________________________

______________________________________________

______________________________________________

(c) අවලම්බයේ බට්ටා ලෙස අරය r වූ ඒකාකාර ලෝහ ගෝලයක් ශිෂ්‍යයා යොදා ගත්තේ ය. අවලම්බ දිග ලෙස ඔහු යොදා ගත් දිග වන $L$ , රූපයේ පෙන්වා ඇත. $L$ ඉදිරියෙන් $T^2$ ප්‍රස්තාරය ඇන්ද පසු එහි අනුක්‍රමණය 4.0 $s^2$ $m^{-1}$ සහ අන්තඃඛණ්ඩය 0.04 $s^2$ බව ඔහු සොයා ගත්තේ ය.




(i) ඉහත ($a$) (ii) හි ප්‍රකාශනය $L$,r සහ $g$ අනුසාරයෙන් නැවත ලියන්න.

____________________________________________________________

____________________________________________________________

(ii) $g$ නිර්ණය කරන්න. ($\pi = 3.1$ ලෙස ගන්න.)

__________________________________________________________________________

__________________________________________________________________________

__________________________________________________________________________

(iii) ගෝලයේ අරය $r$ නිර්ණය කරන්න.

__________________________________________________________________________

__________________________________________________________________________

__________________________________________________________________________

(d) වාත රෝධක බලය හේතුවෙන් දෝලනවල විස්ථාරය කාලය සමග ක්‍රමයෙන් අඩු වී අවසානයේ බට්ටා නිශ්චල වන බව ශිෂ්‍යයා නිරීක්ෂණය කළේ ය. ඔහු එම අරය ම සහිත ලී ගෝලයක් භාවිත කර ගනිමින් ඉහත පරීක්ෂණය නැවතත් කළේ ය. නිශ්චලතාවයට පැමිණීමට අඩු කාලයක් ගන්නේ කුමන බට්ටා ද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

__________________________________________________________________________

__________________________________________________________________________

__________________________________________________________________________